5865

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

I කොටස

(I) සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(II) පහත 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1) (2) (3) (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

- පහත දැක්වෙන කවි සිංදු හා ගීත ඇසුරෙන් අංක 1 සිට 4 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. සුවඳ පද්ම ඕලු ආදි - නොයෙක පුෂ්පයෙන් සැදී

B. මහ මුහුදට නැව ඇවිත් බසින්නේ

C. වැඩපල කළේ තැනුවේ අඹුවත් එක්ක
හැඩ බල බලා තැළුවේ දාගෙන ඔක්ක

D. අත්තක පිපි මලක් ලෙසේ
පෙත්තක ඇඳි ඉරක් ලෙසේ

E. රජුන් අණ විලසට - මුදලිඳු බසින් සහතුට
ආරච්චි මේ සබයට - ඒය විසිතුරු බලනු කදිමට

(1) උඩරට ගැමි නාට්‍යයකට අයත් කවියකි,

(1) A (2) B (3) C (4) D

(2) රට යකුම ශාන්තිකර්මයට අයත් ගායනයකි.

(1) B (2) C (3) D (4) E

(3) නූර්ති ගීතයක කොටසක් වන්නේ,

(1) A (2) B (3) C (4) E

(4) උඩරට ශාන්තිකර්මයක ගායනයක් වන්නේ,

(1) A (2) B (3) C (4) D

(5) නාට්‍ය පෙළක් ප්‍රබල වීමට,

(1) ප්‍රබල රංග වින්‍යාසයක් තිබිය යුතු ය
(2) සංගීතය අත්‍යවශ්‍ය විය යුතු ය.
(3) රංග විධාන සහිත විය යුතු ය.
(4) ප්‍රබල ගැටුම් අවස්ථාවක් තිබිය යුතු ය.

(6) රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණයකි,

(1) නේපථ්‍යාගාරයක් තිබීම
(2) විදුලි පහන් එල්ලීම සඳහා ඉදිරියේ පහසුකම් තිබීම
(3) ප්‍රමාණවත් සමතල අවකාශයක් තිබීම
(4) ප්‍රධාන තිරයක් තිබීම

(7) නාට්‍ය කලාව සෙසු ප්‍රාසංගික කලාවන්ගෙන් වෙනස් වන්නේ,

(1) ප්‍රේක්ෂකයා ඉදිරියේ සජීවීව ප්‍රතිනිර්මාණය වන හෙයිනි.
(2) කලින් සාදා නිම කරන ලද කලා කෘතියක් වන හෙයිනි.
(3) සංගීතය අත්‍යවශ්‍ය නොවන නිසාය.
(4) මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳව පුළුල්ව සාකච්ඡා කළ හැකි වීම නිසා ය.

(8) 'ගලා යන එළිය'' යන අර්ථය ඇතිව පුළුල් කෝණ ආලෝකයක් සපයන්නේ,

(1) ධාරාලෝක පහන මඟිනි
(2) වර්ණ චක්‍රය මඟිනි
(3) යොමු පහන මඟිනි
(4) ස්ට්‍රිප් පහන මඟිනි

(9) නෘත්තයට අදාළ නොවන්නේ,

(1) අංග චලන
(2) සාත්ත්වික අභිනය
(3) රංග භූමිය
(4) සංගීතය

(10) නාට්‍යයක සංගීතය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

(1) නාට්‍යයේ සිදුවීම් හා අවස්ථා උද්දීපනය කරයි.
(2) විකෘති නාට්‍යයේ සංගීත අධ්‍යක්ෂකවරයා සරත් සූරසේන ය.
(3) කතාවේ ඒකාකාරී බව නැති කරයි.
(4) අධ්‍යක්ෂකවරයාගේ අර්ථකථනය සංගීතය සඳහා අවශ්‍ය නොවේ.

(11) මනමේ නාට්‍යයේ වැද්දාගේ චරිතය නිරූපණය කළේ,

(1) බෙන් සිරිමාන්න
(2) එඩ්මන්ඩ් විජේසිංහ
(3) හෙන්රි ජයසේන
(4) ගාමිණී සමරකෝන්

(12) වේදිකා නාට්‍යයක ප්‍රේක්ෂාව පිළිබඳව වගකීම භාරව සිටින්නේ,

(1) වේදිකා පාලකවරයා
(2) ප්‍රධාන සංවිධායකවරයා
(3) රංගාලෝක ශිල්පියා
(4) නාට්‍ය රචකයා

(13) චිත්‍රපට හා නාට්‍ය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි කියමන වන්නේ,

(1) චිත්‍රපට ප්‍රාසංගික කලාවක් වන අතර නාට්‍ය එසේ නොවේ.
(2) චිත්‍රපට දර්ශන නියමිත වේලාවටම පටන් ගන්නා අතර නාට්‍ය එසේ නොවේ.
(3) චිත්‍රපට නළුවාට මෙන්ම නාට්‍ය නළුවාට තම රංගනය නැරඹිය හැකිය,
(4) නාට්‍ය ප්‍රාසංගික කලාවක් වන අතර චිත්‍රපට එසේ නොවේ.

(14) ප්‍රධාන අංග රචනා ප්‍රභේද,

(1) දෙකකි (2) හතරකි (3) පහකි (4) හයකි

- පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 15 සිට 18 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය | මෙරට නිෂ්පාදක / පරිවර්තක |
|---|---|---|---|
| A | හෙන්රික් ඉබ්සන් | ජන හතුරා | සුනන්ද මහේන්ද්‍ර |
| රූඩන්ස් | B | කඹය | බන්ධුල ජයවර්ධන |
| ද ලෝවර් ඩෙප්ත් | මැක්සිම් ගෝර්කි | C | රංජිත් ධර්මකීර්ති |
| මර්චන්ට් ඔෆ් වෙනිස් | ශේක්ස්පියර් | වැනීසියේ වෙළෙන්දා | D |

(15) ඉහත වගුවේ A කොටුවට අයත් විය යුතු මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?

(1) ද ෆාදර් (2) අවර් ටවුන්
(3) වාටුන් (4) ද පබ්ලික් එනමි

(16) ඉහත වගුවේ B කොටුවට අයත් විය යුතු රචකයාගේ නම වන්නේ,

(1) සැමුවෙල් බෙකට් (2) ජ්ලවුටස්
(3) ඇන්ටන් චෙකෝෆ් (4) මොලියර්

(17) ඉහත වගුවේ C කොටුවට අයත් විය යුතු පරිවර්තන නාට්‍ය වන්නේ,

(1) හිරු දහස (2) හිරු නැති ලොව
(3) බක තපස් (4) මකරා

(18) ඉහත වගුවේ D කොටුවට අයත් විය යුතු පරිවර්තකයාගේ නම කුමක්ද?

(1) බන්ධුල ජයවර්ධන (2) ප්‍රසන්න විතානගේ
(3) බන්ධුල විතානගේ (4) සිරිල් සී පෙරේරා

(19) කෝලම් නාට්‍ය ගැන පර්යේෂණ කළ විද්වතෙකු වන්නේ,

(1) සිරිසේන විමලවීර (2) H.M. ජයවර්ධන
(3) M.H. ගුණතිලක (4) චාල්ස් සිල්වා ගුණසිංහ

(20) ආලෝක උපකරණයක් වන්නේ,

(1) අල්ට්‍රා වයලට් (2) ස්ට්‍රෝබ් (3) කලර් වීල් (4) ස්ට්‍රිප්

(21) නාට්‍යවේදිනී සෝමලතා සුබසිංහ ප්‍රසිද්ධ වේදිකාවට පිවිසියේ,

(1) නරිබෑණා නාට්‍යයෙනි
(2) එලොව ගිහින් මෙලොව ආවා නාට්‍යයෙනි
(3) රත්තරන් නාට්‍යයෙනි
(4) මූදු පුත්තු නාට්‍යයෙනි

(22) මනමේ නාට්‍යයේ රංග වින්‍යාසය කරන ලද්දේ,

(1) ජෙරොම් ද සිල්වා
(2) ප්‍රසන්නජිත් අබේසූරිය
(3) සුවිනීතා පෙරේරා
(4) වසන්ත කුමාර

(23) විශ්වනාත් ලව්ජි සංගීත අධ්‍යක්ෂණය කළ කෘතිය වන්නේ,

(1) පද්මාවතී
(2) සිවම්මා ධනපාල
(3) සිරිසඟබෝ
(4) පණ්ඩුකාභය

(24) පරිවර්තන නාට්‍යයක් වන්නේ,

(1) රෝමය ගිනි ගනී
(2) පුතු සමාගම
(3) හරිම බඩු හයක්
(4) කපුවා කපෝති

(25) වේදිකා නාට්‍යයක ප්‍රධාන අරමුණ වන්නේ,

(1) ලාභ ඉපැයීමයි
(2) කතාන්දරයක් කීමයි
(3) රසයක් ඇති කරලීමයි
(4) උපදේශයක් ලබා දීමයි

(26) රංග අභ්‍යාස මගින් නළුවාගේ

(1) සමතෝලය ඇති කරවයි
(2) කය සහ මනසෙහි සමබරතාව ඇති කරයි
(3) ඉවසීමේ ගුණය වර්ධනය කරයි
(4) පෞද්ගලික ප්‍රශ්න අමතක කරවයි

(27) වාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ රචනා නොකල කෘතිය වන්නේ,

(1) කාලිංග
(2) සිරිමල් එතනා
(3) සාලිය අශෝකමාලා
(4) දුටුගැමුණු

(28) 'ජන කරළිය' නම් නාට්‍ය සංවිධානයේ නිර්මාතෘවරයා වන්නේ,

(1) ගාමිණී හත්තොටුවේගම
(2) ගාමිණී හෙට්ටිආරච්චි
(3) නීල් අලස්
(4) පරාක්‍රම නිරිඇල්ල

(29) ටවර් රඟහලෙහි මුලින් ම ඉදිරිපත් කළ නාට්‍ය වර්ගය වූයේ,

(1) ටීටර්
(2) මිනර්වා
(3) නූර්ති
(4) නාඩගම්

(30) පිළිවෙලින් මුද්‍රා නාට්‍ය, ගීත නාට්‍ය, ඔපෙරා සඳහා නිවැරදි වරණය වන්නේ,

(1) කරදිය, දෙපානෝ, මානස විල
(2) නළ දමයන්ති, දෙපානෝ, මානස විල
(3) කරදිය, මානස විල, දෙපානෝ
(4) දෙපානෝ, සකුන්තලා, අග්නි

5862

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක 31 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

(31) ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කළ ප්‍රකට නාට්‍ය රචකයා සිටින ඡායාරූපය,

(1) A (2) B (3) C (4) D

(32) මනමේ කුමරාගේ චරිතය නිරූපණය කළ නිරූපණ ශිල්පීන් දෙදෙනා වන්නේ,

(1) A C (2) A D (3) A E (4) C D

(33) කැළණි පාලම නාට්‍යයේ රංගනයෙන් ජනප්‍රිය වූ රංගධරයා සිටින ඡායාරූපය,

(1) A (2) C (3) D (4) E

(34) සෙල්ලම් නිරිඳු, හඬ නිහඬ වැනි වේදිකා නාට්‍ය රචනා කළ නිර්මාණ ශිල්පියා සිටින ඡායාරූපය,

(1) A (2) B (3) C (4) E

(35) 60 දශකයේ පුරෝගාමී නාට්‍යකරුවෙකු සිටින ඡායාරූපය වනුයේ,

(1) E (2) D (3) C (4) B

(36) ඉස්ලාම් ආගමට සම්බන්ධ ආගමික උත්සවය වනුයේ,

(1) දීපවාලි (2) පාස්කු (3) රාමසාන් (4) නත්තල්

(37) ලෝක ප්‍රකට කෙටි නාට්‍ය රචකයෙක් වන්නේ,

(1) මාෂල් මාෂොව් (2) සැමුවෙල් බෙකට් (3) ඇන්ටන් චෙකෝව් (4) බර්නාඩ් ෂෝ

(38) වේදිකා නාට්‍යයක දෘෂ්ටිය නිර්මාණය වන්නේ,

(1) අධ්‍යක්ෂකවරයා විසිනි (2) රචකයා විසිනි
(3) ආනුෂංගික ශිල්පීන් විසිනි (4) ප්‍රේක්ෂකයා විසිනි

- පහත වෙස් මුහුණු දෙක ඇසුරින් 39, 40 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


A


B

(39) මෙහි දැක්වෙන මුහුණු දෙක අතුරෙන්,

(1) A සන්නි මුහුණකි. B කෝලම් මුහුණකි (2) A කෝලම් මුහුණකි. B සන්නි මුහුණකි
(3) A හා B දෙකම කෝලම් මුහුණුය (4) A හා B දෙකම සන්නි මුහුණුය

(40) මෙම වෙස්මුහුණු දෙක,

(1) අමුක්කු සන්නිය හා මුදලි කෝලමය (2) හේවා කෝලම හා ආරච්චි කෝලමය
(3) ජස කෝලම හා අමුක්කු සන්නියයි (4) නාග සන්නිය හා හේවා කෝලමය

5858

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

## II කොටස

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(1) දික්තල කාලගෝල නාට්‍යය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. මෙම නාට්‍ය ප්‍රථම වරට රඟ දැක්වූ වසර සහ ස්ථානය ලියන්න. (ලකුණු 02)

II. මෙම නාට්‍යයේ රංග ශෛලියෙහි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

III. මෙම නාට්‍යයෙහි නැටුම් නිර්මාණය කළ ශිල්පියා කවුරුන් ද? (ලකුණු 02)

IV. අම්බරයේ සඳ සේ දිලී - රූපාවතී..../ / යන ගීතය ගයන චරිතය නම් කරන්න. (ලකුණු 02)

V. දික්පිටියාගේ මවගේ සහ පියාගේ නම් කුමක්ද? (ලකුණු 02)

VI. නාට්‍ය අවසානයේ ඇති සිංදුව නම් කර ඇත්තේ කෙසේද? (ලකුණු 02)

(2)

I. උඩරට ප්‍රදේශයේ පවත්වන ප්‍රධාන ශාන්තිකර්මය නම් කර, එය පවත්වන අරමුණ ලියන්න. (ලකුණු 02)

II. මෙම ශාන්තිකර්මයේ අන්තර් රංග අවස්ථා හතරක් නම් කරන්න. (ලකුණු 04)

III. ඔබ සඳහන් කළ එක් රංග අවස්ථාවක දක්නට ලැබෙන ආහාර්ය අභිනය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(3)

I. නාඩගම් රචකයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II. නාඩගම් රංග ශෛලියේ ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

III. නාඩගමෙහි පූර්ව රංගනයේ එන්නා වූ ස්ථාවර පාත්‍රයන් පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(4)

I. ''රංග ක්‍රීඩා'' යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

II. රංග ක්‍රීඩා හතරක් නම් කරන්න. (ලකුණු 04)

III. ඔබ නම් කරන ලද රංග ක්‍රීඩාවකින් රූපණ කාර්යයේ දී නළුවෙකුට / නිළියකට ලැබෙන ප්‍රයෝජන මොනවාදැ යි පෙන්වා දෙන්න. (ලකුණු 06)

(5)

I. අංග රචනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

II. අංග රචනා ද්‍රව්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

III. අංග රචනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු 03 ක් සඳහන් කර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(6)

I. විවෘත වීදි නාට්‍ය කණ්ඩායමේ පුරෝගාමියා කවුරුන්ද? (ලකුණු 02)

II. එතුමාගේ වීදි නාට්‍ය හතරක නම් ලියන්න. (ලකුණු 04)

III. වර්තමාන ප්‍රේක්ෂකයාට වීදි නාට්‍ය කලාවෙන් ඇති ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(7) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිත වල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකිය.

අගනුවර ජනප්‍රිය පාසලක 10 ශ්‍රේණියේ ඉගෙන ගන්නා සුපුන් ඉගෙනීමට ඉතා දක්ෂ ශිෂ්‍යයෙකි. ඔහු පවුලේ සිටින එකම දරුවා ය. ඔහුගේ පියා නීතිඥවරයෙකි. මව ගෘහණියකි. පාසලින් යන අධ්‍යාපන චාරිකාව මෙවර යන්නේ නුවරඑළිය බලාය. ඒ සඳහා ඉතා දැඩි ලෙස විරුද්ධ වන පියා බිරිඳට පවසන්නේ තම දරුවා නොයවන ලෙසයි. කෙසේ හෝ මව ගේ කැමැත්ත පරිදි සුපුන් චාරිකාවට සහභාගි වේ. එදින රාත්‍රී රූපවාහිනී ප්‍රවෘත්ති බලමින් සිටි පියාට හදිසියේ දකින්නට ලැබෙන්නේ චාරිකාවට සහභාගී වූ බස් රථය බරපතල අනතුරකට පත් වී .............

I. අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 02)

II. චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා (ලකුණු 04)

III. කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
**Year End Evaluation** - 2022 (2023 මාර්තු)

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II**

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (11) | 2 | (21) | 3 | (31) | 2 |
| (2) | 3 | (12) | 1 | (22) | 4 | (32) | 4 |
| (3) | 1 | (13) | 4 | (23) | 3 | (33) | 4 |
| (4) | 3 | (14) | 1 | (24) | 2 | (34) | 1 |
| (5) | 4 | (15) | 4 | (25) | 3 | (35) | 3 |
| (6) | 4 | (16) | 2 | (26) | 2 | (36) | 3 |
| (7) | 4 | (17) | 2 | (27) | 4 | (37) | 3 |
| (8) | 1 | (18) | 3 | (28) | 4 | (38) | 2 |
| (9) | 2 | (19) | 3 | (29) | 3 | (39) | 1 |
| (10) | 1 | (20) | 3 | (30) | 1 | (40) | 4 |

(ලකුණු 1×40= 40)

## II කොටස

(1)

I. 1975 ජනවාරි 25, ලුම්බිණි රඟහල (ලකුණු 02)

II. පොතේ ගුරු සහ අත්වැල් ගායක කණ්ඩායමක් සිටීම
සංවාද කාව්‍යාත්මකව කීම (ලකුණු 02)

III. මිණිපුර රත්නසේකර මහතා (ලකුණු 02)

IV. දික්පිටියා (ලකුණු 02)

V. පියා - දන්තවූල , මව - චූල දන්තී (ලකුණු 02)

VI. මංගලම් සිංදුව (ලකුණු 02)

(2)

I. කොහොඹා කංකාරිය
සෞභාග්‍ය හා සශ්‍රීකත්වය වෙනුවෙන් (ලකුණු 02)

II. ඌරා යක්කම නයා යක්කම වැදි යක්කම
ගබඩා කොල්ලය ගුරුගේ මාලාව (ලකුණු 04)

III. නයා යක්කම (ආහාර්ය අභිනය)
නයා යක්කමෙහි දක්නට ඇති ආහාර්ය අභිනය මෙසේ දැක්විය හැකිය. නයාගේ දඬුරුව, සම්මාදමේ යන විට භාවිත කරන රෙද්ද, වී කෙටීමට ගන්නා කෝටුව යන සියල්ල ආහාර්ය අභිනයයි. වීදිය නමැති පසුතලය ආහාර්ය අභිනයට අයත් වේ. (ලකුණු 06)

(3)

I. පිලිප්පු සිංඤෝ / වී. ක්‍රිස්තියන් පෙරේරා
චාල්ස් ද සිල්වා (ලකුණු 02)

II. එකම නාඩගම කොටස් වශයෙන් දින ගණනාවක් පෙන්වීම
පිරිමින් පමණක් රංගනයෙහි යෙදීම
දකුණු ඉන්දියානු කර්ණාටක සංගීතය භාවිතය
පූර්ව රංගනයක් සහ අපර රංගනයක් තිබීම (ලකුණු 04)

III. බහුබූත කෝලම

විහිළු චරිතයකි. ඇඟට තද වූ කලිසමක් ද මැදක් දිග ලිහිල් හැට්ටයක් වැනි උඩුකය ඇඳුමක් ද ඔහුට ඇත. හිසෙහි උල් වූ තොප්පියකි. සර්කස් කණ්ඩායම් වල සිටින කවටයාගේ ඇඳුම මෙනි. ඔහු අලංකාර නර්තන විලාසයකින් කරළියෙහි රැඟුම් පායි. (රූප සටහනක් ඇඳ පැහැදිලි කර තිබිය හැකිය.)

මේ ආකාරයට සෙල්ලන් ළමා, දේශනවාදීන්, හඬ දූතයන් යන චරිත පිළිබඳව ද කෙටි හැඳින්වීමක් කර තිබිය යුතුය. (ලකුණු 06)

(4)

I. නළු කාර්යය සාර්ථක කර ගැනීමේ අරමුණෙන් නිර්මාණය කර තිබෙන ක්‍රීඩා රංග ක්‍රීඩා නමින් හැඳින්විය හැකිය. (ලකුණු 02)

II. බල්ලා සහ මස් කට්ට
මීයො පූසො
සිරකරුවා සහ ජේලර්
නායකයා සෙවීම
වෙද පුටුව
මකර වලිගෙ වැනි රංග ක්‍රීඩා හතරක් නම් කර ඇත්නම් (ලකුණු 04)

III. මීයො පූසො, බල්ලා සහ මස් කට්ට වැනි රංග ක්‍රීඩාවකින් රූපණ කාර්යය සඳහා විශාල පිටුවහලක් ලැබේ. සාමූහිකව වැඩ කිරීමේ හැකියාව, අනුවර්තන හැකියාව, ක්ෂණික තීරණ ගැනීමට හැකි වීම, උපක්‍රමශීලී බව වර්ධනය වීම යන කරුණු වර්ධනය කර ගැනීමට හැකි වීම මෙම රංග ක්‍රීඩා මඟින් නළුවකුට ඇති ප්‍රයෝජන බව කිව හැකිය. (ලකුණු 06)

(5)

I. ඇඳුම් වලින් නොවැසෙන මුහුණ ඇතුළුව ශරීරයේ අනෙකුත් අංග රඟපාන චරිතයට ගැලපෙනසේ බාහිරව සකස් කිරීම. (ලකුණු 02)

II. Nose Potty - නෝස් පොටි
Crape Hair - ක්‍රේප් හෙයාර්
Spirit Gum - ස්ප්‍රීට් ගම්
Lining Colours - ලයිනිං කලර්ස්
වැනි අංග රචනා ද්‍රව්‍ය වල නම් ලියා තිබිය යුතුය (ලකුණු 04)

III. නාට්‍යයෙන් නිරූපිත කාලය පිළිබඳව
නාට්‍යයේ රංග ශෛලිය හඳුනා ගැනීම
චරිතයේ ගුණාත්මකභාවය

1. නිරූපිත කාලය අනුව අංග රචනා ද වෙනස් වේ. උඩරට 1815 ගණන් වල නාට්‍යයක් නම් එම යුගයේ කොණ්ඩා, රැවුල් යොදා තිබිය යුතුය.

2. රංග ශෛලිය අනුව අංග රචනා ක්‍රම ද වෙනස් වේ. සිංහබාහු හෝ දික්තල කාලගෝල නාට්‍ය වලට වඩා මෝදර මෝල හෝ විකෘති වැනි නාට්‍ය වල අංග රචනා යොදන ආකාරය වෙනස් වේ.

3. චරිතයේ ස්වරූපය පිළිබඳව කීමේදී කාලගෝල, සිංහයා වැනි චරිත උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

මෙවැනි කරුණු සාකච්ඡා කොට ඇත්නම් ල. 06 දිය හැකිය. (ලකුණු 06)

(6)

I. ගාමිණී හත්තොටුවේගම මහතා (ලකුණු 02)

II. රූකඩයෝ, බෝසත් දැක්ම, ජේසු දැක්ම, ලෝක ආහාර සම්මේලනය, පෝලිම, වෙසක් දැක්ම යනාදී තවත් බොහෝ නාට්‍ය වල නම් ලියා තිබිය හැකිය. (ලකුණු 04)

III. වර්තමාන ප්‍රේක්ෂකයාට ගැලපෙන්නේ වීදි නාට්‍ය බව කිව හැකිය. අතේ ඇති මුදලට නාට්‍යමය අත්දැකීමක් විඳ ගත හැකි වීම විශාල සහනයකි. එමෙන්ම රඟහලකට නොයන මිනිසුන්ටද නාට්‍යයක් නැරඹිය හැකිය. විශාල මුදලකට ප්‍රවේශපත් ගැනීමට නොහැකි ජනයාට වීදි නාට්‍යයක් නොමිලේ දැක බලා ගත හැකිය. වීදි නාට්‍ය මඟින් සමකාලීන සමාජයේ අසාධාරණකම් පිළිබඳව මිනිසුන් දැනුවත් කිරීමට හැකිවීමද තවත් වාසියකි. ජනතාව සිටින තැනට නාට්‍ය කණ්ඩායම යන නිසා සෑම මිනිසෙක්ම දැනුවත් කළ හැකි වීම තවත් ප්‍රයෝජනයකි. සාමාන්‍යයෙන් නාට්‍ය නොබලන ප්‍රේක්ෂකයන්ද මේ මඟින් විශාල දැනුමක් ලබා ගනු ඇත.

මේ ආකාරයට වීදි නාට්‍ය මඟින් සිදුවන සේවය පිළිබඳ ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(7) මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයා ලියා ඇති නාට්‍ය පෙළ කියවා අදාළ ලකුණු ලබා දිය යුතුවේ.

I. අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 02)

II. චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා (ලකුණු 04)

III. කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 06)